සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/2/1 | ඔබේ අංකය / உமது இல / Your No: ........................................ | දිනය / திகதி / Date: 2021.04.29 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2021/09 ට දෙවන එකතුව**

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති කළමණාකරුවන් ,

## Covid- 19 ව්‍යවසනකාරි තත්ත්වය නිසා බලපෑමට ලක් වූ පවුල්වලට රු. 5000/- දීමනාව ගෙවීමේ රාජකාරිවල නිරත නිලධාරින්ට දීමනා ලබාදීම

01. Covid- 19 ව්‍යවසනය හමුවේ ප්‍රතිලාභීන් වෙත දීමනා ලබාදීම සම්බන්ධව අග්‍රාමාත්‍ය ලේකම්ගේ 2021.04.10 දිනැති අංක PTF/03 -2021 චක්‍රලේඛ උපදෙස් අනුව අදාල ප්‍රතිලාභීන් වෙත රු. 5000/- දීමනාව කඩිනමින් ගෙවීම් කිරීම සඳහා රාජකාරි දිනවලට අමතරව සති අන්ත සහ රජයේ නිවාඩු දිනවල රාජකාරිවල නිලධාරින් නිරත කර විමට සිදුවිය. ඒ අනුව රාජකාරි කරන ලද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා අප්‍රේල් මස 12 හා 13 යන නිවාඩු දිනවල එම රාජකාරි ඉටු කිරීම සම්බන්ධව පහත සඳහන් පරිදි නිවාඩු දින දීමනා ලබාගැනීම සඳහා අනුමැතිය සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරණ මණ්ඩලය ලබා දී ඇත.

02. මෙම දීමනා ලබාගැනීමට අනුමත කාර්ය මණ්ඩලය වන්නේ සියලුම බැංකු කළමනාකරුවන්, බැංකු කාර්ය මණ්ඩලය, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය, බැංකු සමිති කළමනාකරුවන් හා බැංකු සමිති කාර්ය මණ්ඩලය, මුලස්ථාන හා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ මෙම කාර්යයේ යෙදුනු නිලධාරින්වේ. ඉහත කාර්ය මණ්ඩල දීමනා ලබාගැනීමේදී බැංකු කාර්ය මණ්ඩලය සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය අදාල බැංකුව වෙතින් ද, බැංකු සමිති කාර්ය මණ්ඩලය අදාල බැංකු සමිතිය වෙතින් ද මෙම නිවාඩු දින දීමනා ලබාගත යුතුවේ.

03. මුලස්ථාන හා දිස්ත්‍රික් කාර්යාලවල එම දිනවල සේවය කරන ලද නිලධාරින් තමන්ගේ නිවාඩු දින දීමනාවන් දිස්ත්‍රික්කය වෙත ලබාදී ඇති ප්‍රතිපාදන වලින් ලබාගන්නා ලෙසත්, යම් ගැටලුවක් ඇත්නම් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් සඳහන් කරමි.

**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරි / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

04. දැනට අනුමත ඇති නිවාඩු දිනයන්ට අමතරව ඉහත සියලුම නිලධාරීන් වෙත මෙම දින දෙක (අප්‍රේල් 12 හා 13) සඳහා නිවාඩු දින දීමනා ලබාගත හැකි බව කාරුණිකව සඳහන් කරමි.

05. ඉහත දීමනාවලට අමතරව අප්‍රේල් 12 හා 13 දින දෙක තුල සිදු කල රාජකාරි වෙනුවෙන් ක්ෂේත්‍ර රාජකාරිවල යෙදුනු කළමනාකරුවන් හා සංවර්ධන නිලධාරීන් සඳහා රු. 1000/- ක ඉන්ධන දීමනාවක් ද අදාල සමෘද්ධි බැංකුව හෝ බැංකු සමිතිය වෙතින් ගෙවීමට ද අනුමැතිය ලබාදෙමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
4. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රජාමූල සංවිධාන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
7. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.